# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1915/19 - 2015 මැයි මස 20 වැනි බදාදා - 2015.05.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### මධ්‍යම පළාතේ පළාත් සභාව

2015 අංක ........ දරන මධ්‍යම පළාතේ පළාත් සභාවේ මධ්‍යම පළාත් මුල් ළමාවිය සංවර්ධන ප්‍රඥප්ති කෙටුම්පත

මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් සහ ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, පළාත් පාලන මිනිස් බල අධ්‍යාපන සහ සංස්කෘතික කටයුතු සංචාරක ඉඩම් සමුපකාර සංවර්ධන වෙළඳ හා වාණිජ ආහාර සැපයුම් සහ බෙදාහැරීම් කටයුතු සහ ආයෝජන සම්බන්ධීකරණ යන විෂයයන් භාර අමාත්‍ය සරත් ඒකනායක වන මම, මෙහි පළ කරන ලද මධ්‍යම පළාත් මුල් ළමාවිය සංවර්ධන ප්‍රඥප්ති කෙටුම්පත මෙම *ගැසට් පත්‍රය* පළ කරන දිනයේ සිට සති 2ක් ඉකුත් වීමෙන් පසු මධ්‍යම පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කරන බව මෙයින් නිවේදනය කරමි. යම් අයෙකුට මෙම ප්‍රඥප්තියේ අඩංගු විධිවිධාන පිළිබඳව ඉදිරිපත් කිරීමට යම් කරුණු හෝ සංශෝධන ඇත්නම් එම කරුණු හෝ සංශෝධන එම කාලය තුළ ලේකම් ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ හැක.

සරත් ඒකනායක,
මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් සහ ක්‍රම සම්පාදන,
නීතිය හා සාමය, පළාත් පාලන මිනිස් බල අධ්‍යාපන සහ සංස්කෘතික කටයුතු සංචාරක
ඉඩම් සමුපකාර සංවර්ධන වෙළඳ හා වාණිජ ආහාර සැපයුම් සහ බෙදාහැරීම් කටයුතු සහ
ආයෝජන සම්බන්ධීකරණ යන විෂයයන් භාර අමාත්‍ය.

2015 මැයි මස 13 වැනි දින,
පල්ලේකැලේ,
මධ්‍යම පළාතේ පළාත් සභාවේ,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

1A - PG 2468 — 08 (2015/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**මධ්‍යම පළාතේ පළාත් සභාවේ 2015 අංක ............. දරන මුල් ළමාවිය සංවර්ධන ප්‍රඥප්තිය**

මධ්‍යම පළාත තුළ මුල් ළමාවිය ඒකකයක් පිහිටුවීම සඳහා ද, මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම, අධීක්ෂණය කිරීම, පරිපාලනය කිරීම හා මෙහෙයවීම සඳහා ද, ඒ හා සම්බන්ධ හෝ ඊට අනුශාංගික කරුණු සඳහා වූ විධිවිධාන සැලැස්වීම සඳහා ද, මධ්‍යම පළාත් සභාවේ 1990 අංක 03 දරන අධ්‍යාපන ප්‍රඥප්තියේ ii වන කොටසේ 12(2) (xii) වන උපවගන්තිය පරිච්ඡින්න කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක දිනය

1. මේ ප්‍රඥප්තිය 2015 අංක .......... දරන මධ්‍යම පළාතේ මුල් ළමාවිය සංවර්ධන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවරයා විසින් අනුමත කරනු ලබන දිනයක සිට ක්‍රියාත්මක වන්නේය.

2. 1990 අංක 03 දරන අධ්‍යාපන ප්‍රඥප්තියේ 12(2)(xii) උප වගන්ති මෙයින් පරිච්චින්න කරනු ලබන අතර ඒ වෙනුවට මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ආදේශ කරනු ලැබේ.

## *I* වන කොටස

*මුල් ළමාවිය සංවර්ධන ඒකකය පිහිටුවීම*

මුල් ළමාවිය

3. දරුවෙකුගේ මුල් ළමාවිය වශයෙන් සැලකෙන්නේ උපතේ සිට විධිමත් පාසල් අධ්‍යාපනයට ඇතුළත්වන දිනය දක්වා කාලයයි.

මධ්‍යම පළාත් මුල් ළමාවිය සංවර්ධන ඒකකය පිහිටුවීම

4. මෙම ප්‍රඥප්තිය තුළ නිශ්චිතව සඳහන් කරනු ලබන පරමාර්ථ ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා මධ්‍යම පළාත් මුල් ළමාවිය සංවර්ධන ඒකකය යනුවෙන් හඳුන්වනු ලබන (මෙහි මින් මතු "ඒකකය" යනුවෙන් සඳහන් කරනු ලබන) ඒකකයක් මධ්‍යම පළාතේ ප්‍රධාන අමාත්‍යාංශය යටතේ පිහිටවනු ලැබේ.

ඒකකය සඳහා අධ්‍යක්ෂවරයකු පත්කිරීම

5. මෙහි මින්මතු "අධ්‍යක්ෂවරයා" යනුවෙන් හඳුන්වනු ලබන තැනැත්තෙකු මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ නිර්දේශය මත පළාත් ආණ්ඩුකාරවරයා විසින් පත්කරනු ලැබිය යුතු අතර ඔහු මෙම ඒකකයේ ප්‍රධානියා විය යුතුය. මෙම ඒකකය සඳහා පත්කරනු ලබන අධ්‍යක්ෂවරයා පළාත් සභාව තුළ සේවය කරන දීපව්‍යාප්ත සේවාවක නිලධාරියෙකු විය යුතුය.

අධ්‍යක්ෂවරයාගේ වගකීම හා පාලනය

6. (1) මෙම ප්‍රඥප්තියේ අරමුණු සාක්ෂාත් කරදීම අධ්‍යක්ෂවරයාගේ වගකීම වන අතර කළමනාකරණ මණ්ඩලයේ අධීක්ෂණය සහ පාලනය යටතේ අධ්‍යක්ෂවරයා කටයුතු කළ යුතු වන්නේය.

අධ්‍යක්ෂවරයාගේ ධූර කාලය

(2) මිය යාම, ඉල්ලා අස්වීම, ධූරයෙන් ඉවත්කරනු ලැබීම නිසා හෝ කලින් ධූරය අත්හරිනු ලැබුවහොත් මිස ස්වකීය පත්වීම් දිනයේ සිට අවු. 03 ක කාලයක් අධ්‍යක්ෂවරයාට ධූරය දැරිය හැකි වන්නේය.

අධ්‍යක්ෂධූරය සඳහා නැවත පත්කිරීම

(3) (2) උප වගන්තිය යටතේ ධූරයෙන් ඉවත් කරනු ලැබූ තැනැත්තෙකු නොවේ නම් අධ්‍යක්ෂවරයා නැවත පත්වීම් ලැබීමට සුදුස්සෙකු විය හැකිය.

අධ්‍යක්ෂධූරය පුරප්පාඩු වීම

(4) අධ්‍යක්ෂවරයාගේ ධූරයේ යම් පුරප්පාඩුවක් ඇති වුවහොත් නව අධ්‍යක්ෂවරයෙක් පත්කරනු ලැබිය යුතු අතර එලෙස පත් කරනු ලබනතෙක් ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන මාණ්ඩලික නිලධාරියෙකු එකී ධූරයේ කටයුතු කර ගෙන යාම සඳහා පත් කරනු ලැබිය හැකිය.

ඒකකය සඳහා කාර්ය මණ්ඩලය පත්කිරීම

7. ඒකකයේ අරමුණු ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි කාර්ය මණ්ඩලය මධ්‍යම පළාත් රාජ්‍ය සේවයෙන් පත්කරනු ලැබිය හැකිය.

8. ඒකකයේ අරමුණු පහත සඳහන් පරිදි විය යුතුය :-

ඒකකයේ අරමුණු

(1) පළාතේ මුල් ළමාවිය අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම,

(2) මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම, කළමණාකරනය සහ අධීක්ෂණය කිරීම,

(3) මුල් ළමාවිය අවධියේ පසුවන ළමුන්ගේ කායික, මානසික ඇතුළු සමස්ථ සංවර්ධනයට හිතකර පරිසරයක් ඇති කිරීම,

(4) මුල් ළමාවිය අවධියේ පසුවන ළමුන්ගේ අයිතීන් සුරක්ෂිත කර නිසි රැකවරණයක් ලබා දීම,

(5) පූර්ව ළමා විය අවධිය සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය විය හැකි යැයි හැගෙන වෙනත් පියවරයන් ගැනීම.

9. ඒකකයේ කාර්යයන් සහ බලතල පහත සඳහන් පරිදි වේ :-

ඒකකයේ කාර්යයන් සහ බලතල

(1) මුල් ළමාවිය සම්බන්ධව කටයුතු කරන මධ්‍යම පළාතේ සියලු ආයතන ලියාපදිංචි කිරීම, අධීක්ෂණය හා නියාමනය,

(2) මුල් ළමාවිය සංවර්ධන කටයුතු වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීම හා අධාර ලබා දීම,

(3) මධ්‍යස්ථානවල උපදේශක උපදේශිකාවන් සඳහා අවශ්‍ය අවම සුදුසුකම් නියම කිරීම,

(4) මධ්‍යස්ථානවල උපදේශක උපදේශිකාවන් පුහුණු කිරීම,

(5) මධ්‍යස්ථානවල උපදේශක උපදේශිකාවන් පුහුණු කිරීම හා සංවර්ධනය කිරීම සඳහා පුහුණු ආයතන පවත්වාගෙන යාම හා වෘත්තීය නිපුණතාවයන් මත ශ්‍රේණිගතකර සහතික පත්‍ර පිරිනැමීම,

(6) මුල් ළමාවිය සංවර්ධනය මධ්‍යස්ථානවල සේවා පහසුකම් හා කාර්යමණ්ඩලය ඇගයිමකට භාජනය කර ශ්‍රේණිගත කිරීම,

(7) මධ්‍යස්ථානවල පාලනය හා කළමණාකරනය පිළිබඳ අවම ප්‍රමිති නියම කිරීම,

(8) මුල් ළමාවිය සංවර්ධනයේ වැදගත්කම පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම,

(9) පළාත තුළ පවත්වාගෙන යනු ලබන ඕනෑම මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක් මෙම ප්‍රඥප්තියේ විධිවිධානයන්ට අනුකූල නොවන්නේ නම් එම මධ්‍යස්ථානය තාවකාලිකව අත්හිටුවීම හෝ නතර කිරීම,

(10) ඒකකය විසින් සලසනු ලබන යම් සේවාවක් සඳහා ගාස්තු හෝ මුදල් අය කිරීම,

(11) මධ්‍යස්ථානයක් විසින් පවත්වාගෙන යා යුතු යැයි නියම කරනු ලබන පොත් පත්, ලිපි ලේඛන හා ආකෘති පත්‍ර හඳුන්වාදීම හා ඒවා භාවිතා කිරීමට සැලැස්වීම,

(12) මුල් ළමාවිය සංවර්ධනයට අදාළ කාර්යයන් ඉටු කිරීම සඳහා බාහිර පාර්ශවයන් සමග ගිවිසුම්වලට එළඹීම සහ සම්බන්ධීකරණයන් පවත්වාගෙන යෑම.

(13) විශේෂ අවශ්‍යතා ඇති දරුවන්, ඔවුන්ගේ දෙමව්පියන් සහ ප්‍රජාව සඳහා සුදුසු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම,

(14) මධ්‍යස්ථාන වලට ඇතුල්වීම හා ඒවා නිසි ප්‍රමිතියෙන් පවත්වාගෙන යන්නේද යන්න පරීක්ෂා කිරීම,

(15) මධ්‍යම පළාත තුළ මුල් ළමාවිය සංවර්ධනය සඳහා අවශ්‍ය විය හැකි වෙනත් කාර්යයන් හා බලතල.

## *II* වන කොටස

### *කළමණාකරන හා උපදේශක කමිටු පත් කිරීම*

කළමණාකරන හා උපදේශක කමිටු

10. මෙම ප්‍රඥප්තියේ සඳහන් කාර්යයන් ඉටු කරණු ලැබීම සඳහා (මෙහි මින් මතු කමිටු යනුවෙන් හඳුන්වනු ලබන) කළමණාකරන කමිටුවක් හා උපදේශක කමිටුවක් පිහිටවනු ලැබිය යුත්තේය.

කළමණාකරන කමිටුව

11. ඒකකයේ කාර්යයන් මෙහෙයවීම හා අධීක්ෂණය සඳහා එකලොස් දෙනෙකුගෙන් සමන්විත "කළමණාකරන කමිටුව" යනුවෙන් හඳුන්වනු ලබන කමිටුවක් පළාත් ප්‍රධාන ලේකම්වරයා විසින් පත් කරනු ලැබිය යුතුය.

කළමණාකරන කමිටුවේ සංයුතිය

12. කළමණාකරන කමිටුව පහත සඳහන් සමාජිකයින්ගෙන් සමන්විත විය යුතුය :-

(1) පළාත් ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(2) පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(3) පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ;

(4) පළාත් පාලන කොමසාරිස් ;

(5) පළාත් පරිවාස හා ළමාරක්ෂක කොමසාරිස් ;

(6) පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ;

(7) නියෝජ්‍ය පොලිස්පති හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයෙක් ;

(8) වැවිලි මානව සංවර්ධන භාරයේ අධ්‍යක්ෂ හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයෙක් ;

(9) මුල් ළමාවිය සංවර්ධන ඒකකයේ අධ්‍යක්ෂ ;

(10) ප්‍රධාන අමාත්‍යවරයා විසින් විෂය ක්ෂේත්‍රයට අදාළව නම් කරනු ලබන සාමාජිකයින් දෙදෙනෙක්.

කළමණාකරන කමිටුවේ සභාපති සහ ලේකම්

13. ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම් නිල බලයෙන් කළමණාකරන කමිටුවේ සභාපති විය යුතු අතර ඒකකයේ අධ්‍යක්ෂවරයා කළමණාකරන කමිටුවේ ලේකම් විය යුතුය.

කළමණාකරන කමිටුවේ කාර්යයන් සහ බලතල

14. කළමණාකරන කමිටුව විසින් පහත දැක්වෙන කාර්යයන් හා බලතල ඉටු කළ යුතුය :-

(1) මෙම ප්‍රඥප්තියට අදාළව ප්‍රතිපත්ති සකස් කර අනුමැතිය සඳහා අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම ;

(2) මෙම ප්‍රඥප්තියේ සඳහන් කාර්යයන් හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය රෙගුලාසි හා චක්‍රලේඛණ පැනවීමේදී හා ඒවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් සැපයීම ;

(3) මුල් ළමාවිය සංවර්ධන විෂය සම්බන්ධව කටයුතු කරන රාජ්‍ය හා රාජ්‍ය නොවන පාර්ශවයන්ට පළාත තුළ ක්‍රියාත්මකවීමට අවශ්‍ය උපදෙස් හා අනුමැතිය ලබා දීම ;

(4) මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා ඒකකය වෙත අවශ්‍ය උපදෙස් නිකුත් කිරීම ;

(5) ඒකකයේ කාර්යයන් මෙහෙයවීම හා අධීක්ෂණය සඳහා අවශ්‍යවන්නාවූ අනෙකුත් උපදෙස් හා මගපෙන්වීම් ලබාදීම ;

කළමණාකරන කමිටුවේ තීරණ

15. කළමණාකරන කමිටුවේ රැස්වීමක සණපූර්ණය පස් දෙනෙකු විය යුතු අතර පැමිණ සිටින සාමාජිකයින්ගේ බහුතර එකඟතාවය මත තීරණ ගත යුතුය. සාමාජිකයින්ගේ එකඟතාවයන් සමානවන අවස්ථාවන්හිදී කමිටුවේ සභාපතිවරයාට තීරක ඡන්දයක් හිමිවිය යුතුය.

16. කළමණාකරන කමිටුවේ කාර්යයන් පවත්වාගෙනයාම සඳහා අවශ්‍ය උපදෙස් සහ මගපෙන්වීම් ලබාදීම සඳහා පහලොස් දෙනෙකුගෙන් සමන්විත "උපදේශක කමිටුව" යනුවෙන් හැඳින්වෙන කමිටුවක් පත්කළ යුතුය. උපදේශක කමිටුව

17. (1) උපදේශක කමිටුව නිල බලයෙන් පත්වන සාමාජිකයින් දොලොස් දෙනෙකුගෙන් සහ ප්‍රධාන අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන කළමණාකරන කමිටුවේ සාමාජිකයින් නොවන වෙනත් සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතුය. උපදේශක කමිටුවේ සාමාජිකයින් පත් කිරීම ප්‍රධාන අමාත්‍යවරයා විසින් සිදු කළ යුතුය. උපදේශක කමිටුවේ සංයුතිය

(2) උපදේශක මණ්ඩලය සඳහා නිල බලයෙන් පත්වන සාමාජිකයන් පහත පරිදි විය යුතුය :-

(අ) මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් ;

(ආ) පළාත් ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(ඇ) පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(ඈ) පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(ඉ) මධ්‍යම පළාත තුළ සිටින දිස්ත්‍රික් ලේකම්වරුන්ගෙන් කෙනෙක් ;

(ඊ) නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුදල්) ;

(උ) පළාත භාර නියෝජ්‍ය පොලිස්පති ;

(ඌ) පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ;

(එ) ජාතික ළමා ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයෙක් ;

(ඒ) පේරදෙණිය විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයා විසින් නම් කරනු ලබන අධ්‍යයන කාර්යමණ්ඩලයේ නියෝජිතයෙක් ;

(ඔ) වැවිලි මානව සංවර්ධන භාරයේ අධ්‍යක්ෂ හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයෙක් ;

(ඕ) මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අධ්‍යාපන විෂය භාර අධ්‍යක්ෂවරයා ;

(3) උපදේශක මණ්ඩලය සඳහා අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයන් පහත පරිදි විය යුතුය :-

(අ) මුල් ළමාවිය සංවර්ධනය පිළිබඳ මනා පරිචයක් ඇති නියෝජිතයෙක් ;

(ආ) මධ්‍යම පළාත තුළ මුල් ළමාවිය සංවර්ධන කාර්යයන්හි නියුතු නියෝජිතයෙක් ;

(ඇ) මධ්‍යම පළාත තුළ මුල් ළමාවිය සංවර්ධන විෂයට අදාළව සක්‍රියව කටයුතු කරන රාජ්‍ය නොවන සංවිධානයක හෝ ශ්‍රී ලංකාව තුළ පිළිගත් විදේශීය ප්‍රදායක ආයතනවල නියෝජිතයෙක් ;

18. පළාත් ප්‍රධාන ලේකම්වරයා උපදේශක කමිටුවේ සභාපතිවරයා විය යුතු අතර ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම්වරයා උපදේශක කමිටුවේ ලේකම්වරයා විය යුතුය. උපදේශක කමිටුවේ සභාපති හා ලේකම්

19. උපදේශක කමිටුවේ නිල කාලය අවු. 03 කි. උපදේශක කමිටුවේ නිල කාලය

20. ප්‍රඥප්තියේ වෙනත් විධිවිධාන වලට යටත්ව උපදේශක කමිටුව පවත්වාගෙන යාම සඳහා අදාළ වන කරුණු සම්බන්ධයෙන් ක්‍රියා පටිපාටි උපදේශක කමිටුව විසින් සකස් කළ යුතුය. උපදේශක කමිටුව පවත්වාගෙන යාම

උපදේශක කමිටුවේ කාර්ය හා කර්තව්‍ය

21. මෙම ප්‍රඥප්තියේ අරමුණු සහ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය උපදේශක සේවාවන් කළමණාකරන කමිටුව වෙත ලබා දීම උපදේශක කමිටුවේ කාර්යභාරය වන්නේය.

කමිටුවල සාමාජිකධූර කාලය

22. කමිටුවක නම් කළ සාමාජිකයෙකු මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන්, ධූරයෙන් ඉවත්කරනු ලැබීමෙන් හෝ කලින් ධූරය අත්හළහොත් මිස වසර තුනක කාලයක් ධූරය දැරිය යුතුය.

කමිටුවල සාමාජිකධූරය අහිමි වීම

23. කමිටුවක නම් කළ සාමාජිකයෙකු පිළිගත හැකි හේතුවක් නොමැතිව නොදන්වා සභාවේ රැස්වීම් තුනකට පිටපිටම නොපැමිණියහොත් එම සාමාජිකයා ධූරය අත්හැර ගිය අයෙකු ලෙස සළකනු ලැබිය යුතු අතර කමිටුවේ ලේකම් විසින් ඒ බව ප්‍රධාන ඇමතිවරයා වෙත දැනුම් දීමෙන් අනතුරුව ඒ සඳහා සුදුසු අනුප්‍රාප්තිකයෙකු ප්‍රධාන ඇමතිවරයා විසින් පත් කළ යුතුය.

කමිටුවල සාමාජිකධූරයෙන් ඉවත් කිරීම

24. කමිටුවක නම් කළ සාමාජිකයෙකු ඕනෑම අවස්ථාවක ප්‍රධාන අමාත්‍යවරයා විසින් ලිඛිත දැනුම්දීමකින් අනතුරුව කමිටු සාමාජිකත්වයෙන් ඉවත් කළ හැකිය.

කමිටුවල සාමාජිකධූරයෙන් ඉල්ලා අස්වීම

25. කමිටුවක නම් කළ සාමාජිකයෙකුට තමා ධූරයෙන් ඉල්ලා අස්වෙන බවට ප්‍රධාන අමාත්‍යවරයා වෙත ලිඛිත දැනුම් දීමක් කළ හැකි අතර එම ඉල්ලා අස්වීම ප්‍රධාන අමාත්‍යවරයා විසින් භාරගත් පසු ඉල්ලා අස්වීම බලාත්මක විය යුතුය.

කමිටුවල සාමාජිකධූරය හිස්වීම

26. කමිටුවක සාමාජිකයෙකු මියයාමෙන්, ඉල්ලා අස්වීමෙන්, ධූරයෙන් ඉවත්කරනු ලැබීමෙන් හෝ අන්‍යාකාරයකින් ධූරය හිස්වන අවස්ථාවක ප්‍රධාන අමාත්‍යවරයා විසින් 12 සහ 17 වන වගන්තිවල සඳහන් විධිවිධාන සැලකිල්ලට ගෙන ඒ සාමාජිකයාගේ අනුප්‍රාප්තිකයෙකු වශයෙන් වෙනත් තැනැත්තෙක් පත් කළ යුතුය. එසේ පත් කරන ලද තැනැත්තෙකු ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධූර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලය සඳහා ධූරය දැරිය යුතුය.

කමිටුවක සාමාජිකධූරය සඳහා නැවත පත්කිරීම

27. කමිටුවක සාමාජිකයෙකු ලෙස වරක් නම් කළ තැනැත්තෙක් නැවත වරක් කමිටුවේ සාමාජිකයෙකු ලෙස නම් කළ හැකිය.

කමිටුවල රැස්වීම්

28. කමිටුවක් අවම වශයෙන් මාස 03 කට වරක්වත් රැස්විය යුතුය.

කමිටුවල සාමාජිකත්වයට නුසුදුසුකම්

29. යම් තැනැත්තෙක් :-

(1) ශ්‍රී ලංකා පුරවැසියෙකු නොවේ නම් හෝ පුරවැසියෙකු වී සිටීම නතරවුවහොත් හෝ ;

(2) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල් වී හෝ බංකොළොත් භාවයට පත්වී සිටින බවට ප්‍රකාශයට පත් කරනු ලැබ සිටීනම් හෝ ;

(3) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් රටක අධිකරණයක් විසින් නියමකරනු ලබන බන්ධනාගාර ගත කිරීමේ දඬුවමක් විඳීනම් හෝ විඳ ඇත්නම් හෝ ;

(4) කමිටුවක සාමාජිකයෙකු වශයෙන් ඔහු විසින් ඔහුගේ කාර්යයන් ඉටු කිරීමේ දී හානිකර ලෙස බලපෑමට ඉඩ තිබෙන යම් මූල්‍යමය හෝ වෙනත් සම්බන්ධතාවයක් දරන බව ප්‍රධාන අමාත්‍යවරයාගේ මතය වන්නේ නම් හෝ ;

(5) මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු කරනු ලැබුවහොත් හෝ.

කමිටුවක සාමාජිකයෙකු ලෙස පත් කිරීමට හෝ කටයුතු කිරීමට නුසුදුස්සෙකු විය යුතුය.

කමිටුවක ක්‍රියාවක් නිර්බලවීම

30. කමිටුවක කිසිදු ක්‍රියාවක්, තීරණයක් හෝ නීති කර්තව්‍යක් කමිටුවේ පුරප්පාඩුවක් හෝ එහි යම් සාමාජිකයෙකුගේ පත්වීම් දෝෂයක් තිබීම හේතුවෙන් නිර්බල වූ ලෙස සලකනු නොලැබිය යුතුය.

කමිටුවල සාමාජිකත්වයට පරිශ්‍රම ගෙවීම

31. කමිටුවක සාමාජිකයන්ට ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය සහිතව ප්‍රධාන අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් පරිශ්‍රම ගෙවනු ලැබිය හැකිය.

## *III* වන කොටස

*මධ්‍යම පළාත් මුල් ළමාවිය සංවර්ධන අරමුදල*

32. (1) මධ්‍යම පළාත් මුල් ළමාවිය සංවර්ධන ඒකකය සඳහා පූර්ව ළමාවිය සංවර්ධන අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් තිබිය යුතු අතර පහත සඳහන් අරමුදල් එම අරමුදලට බැර කරනු ලැබිය යුතුය ෑ මුල් ළමාවිය සංවර්ධන අරමුදල

(අ) ඒකකය සඳහා පළාත් සභාව විසින් වරින් වර ලබා දෙන සියලු මුදල් ෑ

(ආ) ඒකකය සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවලින් ලැබෙන මුදල් ෑ

(ඇ) ඒකකය විසින් තම කාර්යයන් ඉටු කිරීම මගින් රැස් කරනු ලබන හෝ අයකර ගනු ලබන මුදල් ෑ

(ඈ) වෙනත් ආධාර හා ප්‍රදානයන්.

(2) ඒකකයේ කාර්යයන් ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය වන මුදල් කළමණාකරන මණ්ඩලය විසින් තීරණය කරන ආකාරයට යොදාගත යුත්තේය.

(3) එක් එක් මුදල් වර්ෂය වෙනුවෙන් වර්ෂයේ ආදායම් හා වියදම් සහ වෙනත් සියලු ගණුදෙනු ඇතුළත් වාර්ෂික ගිණුම් ප්‍රකාශනයක් පිළියෙල කළ යුතුය.

33. ඒකකයේ මුදල් වර්ෂය ජනවාරි මස 1 දින සිට දෙසැම්බර් මස 31 වැනි දින දක්වා විය යුතුය. අරමුදලේ මුදල් වර්ෂය

34. විගණකාධිපතිවරයා විසින් සෑම වර්ෂයකම පළාත් ඒකකයේ ගිණුම් විගණනය කරනු ලැබිය යුතුය. අරමුදලේ ගිණුම් විගණනය

## *IV* වන කොටස

*මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම*

35. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මකවීමේ දින සිට සහ ඉන් පසුව තත්කාර්ය සඳහා මේ ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ ලියාපදිංචි නොවී පළාත තුළ කිසිදු මධ්‍යස්ථානයක් පවත්වාගෙන නොයා යුතු ය. මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම

36. (1) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින සිට පළාත තුළ ක්‍රියාත්මක වන සියලුම මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ඒකකය යටතේ ලියාපදිංචි සහතිකය ලබා ගත යුතුය. දැනට පවත්වා මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම

(2) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දින සිට මාස තුනක් ඉකුත්වීමට පෙර ඒ වන විට පළාත තුළ පවත්වාගෙන යනු ලබන සෑම මධ්‍යස්ථානයකම අයිතිකරු හෝ කළමණාකරු හෝ පාලක එකී මධ්‍යස්ථාන ලියාපදිංචි කරන ලෙස අධ්‍යක්ෂවරයා වෙත ඉල්ලුම් කළ යුතුය.

(3) (2) උප වගන්තිය යටතේ ඉල්ලුම් කිරීමට අපොහොසත් වූ කිසියම් අයිතිකරුවකු හෝ කළමණාකරුවකු හෝ පාලකයෙකු හෝ යුක්ති සහගත සහ සාධාරණ යැයි බැලූ බැල්මට පෙනෙන හේතු සහිතව ඉල්ලීමක් කරනු ලැබූ විට ඉකුත් වූ කාලය සැලකිල්ලට ගෙන අධ්‍යක්ෂවරයා විසින් කිසියම් ගාස්තුවක් අයකර ලියාපදිංචි කළ හැකිය.

(4) ඉහත (2) හෝ (3) වගන්ති යටතේ ලියාපදිංචි කිරීමට ඉල්ලුම් කරන මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයකට තිබිය යුතු මානව සහ භෞතික සම්පත්වල ප්‍රමිතීන් නිසි පරිදි නොමැති නම් එවැනි ආයතනයකට අදාළ ප්‍රමිතීන් සම්පූර්ණ කර ගැනීම සඳහා වසර 03 ක සහන කාලයක් සහ තාවකාලික ලියාපදිංචියක් ලබා දිය හැක්කේ ය.

37. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනෙන් පසු අලුතින් ආරම්භ කරනු ලබන මධ්‍යස්ථාන ආරම්භ කිරීමට පෙර අධ්‍යක්ෂවරයා වෙත ඉල්ලීමක් කර ලියාපදිංචි කළ යුතුය. අලුතින් ආරම්භ කරන මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම

පුහුණු වැඩ සටහන් පවත්වන ආයතන ලියාපදිංචි කිරීම

38. මුල් ළමාවිය සංවර්ධනය සඳහා පාඨමාලා හෝ පුහුණු වැඩසටහන් මෙහෙයවමින් පළාත තුළ ක්‍රියාකාරිත්වයේ යෙදෙන ඕනෑම රාජ්‍ය, පෞද්ගලික හෝ රාජ්‍ය නොවන ආයතනයක් ඒ සඳහා ඒකකය යටතේ ලියාපදිංචි විය යුතුය.

ලියාපදිංචි වීම සඳහා සුදුසුකම් සහ ලියාපදිංචි ගාස්තු

39. (1) ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම්කරු අධ්‍යක්ෂවරයා විසින් නියම කරනු ලබන ලියාපදිංචි ගාස්තුවක් ගෙවිය යුතුය.

(2) ලියාපදිංචි කිරීමට අවශ්‍ය සුදුසුකම්, ලියාපදිංචි ගාස්තු හා අනෙකුත් විධිවිධාන අමාත්‍යවරයා විසින් රෙගුලාසි මගින් නියම කරනු ලැබිය යුත්තේ ය.

(3) ලියාපදිංචිවීමේ කාලය දීර්ඝ කිරීම සඳහා ද, ලියාපදිංචි වීමට ප්‍රමාද වන කාලය සඳහා ද අතිරේක ගාස්තුවක් හෝ දඩ මුදලක් අය කිරීමට ඒකකයට බලය ඇත්තේය.

ලියාපදිංචි සහතිකය නිකුත් කිරීම

40. (1) මධ්‍යස්ථානයක් ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පතක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක එකී මධ්‍යස්ථානය ලියාපදිංචි අවශ්‍යතා සපුරා ඇති බවට අධ්‍යක්ෂවරයා සෑහීමකට පත්වන්නේ නම් ලියාපදිංචි සහතිකය නිකුත්කල යුතු අතර, ලියාපදිංචි කිරීමේ අවශ්‍යතා සපුරා නොමැති බවට අධ්‍යක්ෂවරයා තීරණය කරයි නම් හේතු දක්වමින් අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය.

තාවකාලික ලියාපදිංචි සහතිකය නිකුත් කිරීම

(2) (අ) ලියාපදිංචිය සඳහා වන සුදුසුකම් යම් මධ්‍යස්ථානයක් විසින් සපුරා නොමැති විටකදී, එම සුදුසුකම් වසර 03 කාලයක් තුලදී සම්පූර්ණ කළ යුතුබවට කොන්දේසියක් ඇතුළත් කොට තාවකාලික ලියාපදිංචි සහතිකයක් නිකුත් කරනු ලැබිය හැකිය.

(ආ) වසර තුනක කාලය අවසානයේ ලියාපදිංචි සුදුසුකම් තවදුරටත් සපුරා නොමැතිබවට අධ්‍යක්ෂවරයාට පෙනී යයි නම් තාවකාලිකව නිකුත් කරන ලද ලියාපදිංචි සහතිකය අවලංගු කිරීමේ බලය අධ්‍යක්ෂවරයා සතු වන්නේය.

ප්‍රතික්ෂේප කරන ලද අයදුම්පතක් සම්බන්ධ අභියාචනා

41. (1) ප්‍රතික්ෂේප කරන ලද අයදුම්පතක් සම්බන්ධයෙන් ප්‍රතික්ෂේප කරන ලද දැන්වීම ලද දින සිට දින 30ක් ඇතුළත ලේකම්වරයා වෙත අභියාචනාවක් ඉදිරිපත් කිරීමේ හැකියාව ඇත්තේය.

(2) එවැනි අභියාචනයක් ලැබූවිට ලේකම්වරයා විසින් කළමණාකරන කමිටුව වෙත එය යොමු කොට එහි නිරීක්ෂණ හා නිර්දේශය ලබා ගනිමින් එකී අභියාචනය සම්බන්ධයෙන් තම නිරීක්ෂණ ද සඳහන් කර ප්‍රධාන ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

(3) ලේකම්වරයා විසින් ඉදිරිපත් කරන අභියාචනය සම්බන්ධයෙන් තීරණය දීමේ බලය ප්‍රධාන ලේකම්වරයාට ඇති අතර ප්‍රධාන ලේකම්වරයා විසින් ගනු ලබන තීරණය අවසානාත්මක හා තීරණාත්මක වන්නේය.

ලියාපදිංචි නොකළ මධ්‍යස්ථාන පවත්වාගෙන යාම

42. මෙම ප්‍රඥප්තිය යටතේ සඳහන් විධිවිධාන උල්ලංඝනය කරමින් ලියාපදිංචි නොකළ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යනු ලබන යම් තැනැත්තෙකු හෝ පුද්ගල මණ්ඩලයක් මෙම ප්‍රඥප්තිය යටතේ වරද කරනු ලබන අයෙකු ලෙස සැලකේ.

ලියාපදිංචි සහතිකය ප්‍රදර්ශණය කිරීම

43. (1) ඒකකය විසින් ලියාපදිංචි කරන සෑම මධ්‍යස්ථානයක් සඳහාම අංකයක් සහිත ලියාපදිංචි සහතිකයක් නිකුත් කළ යුතු අතර එකී සහතිකය මධ්‍යස්ථානයේ ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

(2) ඒකකය විසින් ලියාපදිංචි කරනු ලබන මධ්‍යස්ථාන සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වාගෙන යා යුතුය.

(3) ඒකකය මගින් නිකුත් කරන ලද ලියාපදිංචි සහතිකය වෙනත් යම් තැනැත්තෙකු වෙත ඒකකයේ පූර්ව අනුමැතියෙන් තොරව පවරනු ලැබිය නොහැකි අතර, එවැනි පැවරීමක් ශූන්‍ය හා බල රහිත වන්නේය.

(4) ලියාපදිංචි සහතිකයක් විධිමත්ව පැවරීමක් සම්බන්ධයෙන් අදාලවන විධිවිධාන ඇමතිවරයා විසින් රෙගුලාසි මගින් පනවනු ලැබිය යුතු ය.

44. යම් මධ්‍යස්ථානයක් සඳහා ලියාපදිංචි සහතිකයක් නිකුත් කර ඇතත්, පහත අවස්ථාවලදී, එනම්

ලියාපදිංචි සහතිකය අවලංගු කළ හැකි අවස්ථා

(1) ලියාපදිංචි කිරීමේ මූලික අවශ්‍යතා එකක් හෝ කිහිපයක් උල්ලංඝනය වීම,

(2) මධ්‍යස්ථානක හිමිකාරත්වය වෙනස්වන අවස්ථාවක ඒබව ඒකකය වෙත දැනුම් දී විධිමත් ලියාපදිංචි සංශෝධනයක් කර නොගැනීම යන අවස්ථා වලදී එහි ලියාපදිංචි සහතිකය කළමණාකරන කමිටුවේ තීරණ මත අවලංගු කිරීමේ බලය අධ්‍යක්ෂවරයාට ඇත්තේය.

## V වන කොටස

### පොදු විධිවිධාන

45. (1) අමාත්‍යවරයා විසින් කළමනාකරණ මණ්ඩලයේ අදහස් විමසා මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම, මධ්‍යස්ථානයක තිබිය යුතු අවම ප්‍රමිතීන් නියම කිරීම සහ මෙම ප්‍රඥප්තියේ කාර්යයන් ඉටු කර ගැනීමට අවශ්‍යවන අනෙකුත් රෙගුලාසි සහ නියෝග සාදනු ලැබිය හැකිය.

රෙගුලාසි සහ නියෝග

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම රෙගුලාසියක්ම හෝ නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමේ දින සිට හෝ ඒ නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනක සිට හෝ ක්‍රියාත්මක විය යුතුය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම රෙගුලාසියක්ම හෝ නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි ඉක්මනින් අනුමැතිය සඳහා පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. පළාත් සභාව විසින් අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් හෝ රෙගුලාසියක් එකී අනනුමතයේ දිනයේ සිට එකී රෙගුලාසිය හෝ නියෝග යටතේ කලින් කරන ලද ක්‍රියාවකට ඉන් හානියක් නොවන පරිදි පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතුය.

(4) යම් රෙගුලාසියක් හෝ නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කළ යුතුය.

(5) මෙම ප්‍රඥප්තිය යටතේ සාදනු ලබන රෙගුලාසි හෝ නියෝග පළාත් සභාවේ සම්මත වීමෙන් පසුව ඒවා මෙම ප්‍රඥප්තිය මගින් පැනවූවාක් මෙන් බලාත්මක විය යුතුය.

46. ඒකකයේ නිලධාරීන් හා සේවකයින් දණ්ඩ නීති සංග්‍රහය සහ ආයතන සංග්‍රහයේ අර්ථානුකූලව හා කාර්යයන් සඳහා රජයේ සේවකයින් ලෙස සලකනු ලැබිය යුතුය.

නිලධාරීන් සහ සේවකයින් රජයේ සේවකයින් ලෙස සැලකිය යුතු බව

47. ඒකකය අල්ලස් පනත යටතේ අර්ථානුකූලව උපලේඛන ගත ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර ඒ පනතේ විධිවිධාන යටතේ කටයුතු කළ යුතුය.

අල්ලස් පනතේ කාර්යය සඳහා ඒකකය උපලේඛණ ගත ආයතනයක් වන බව

48. (1) මෙම ප්‍රඥප්තියේ යම් ප්‍රතිපාදනයක් හෝ ඒ යටතේ සම්පාදනය කරන ලද රෙගුලාසියක හෝ නියෝගයක හෝ යම් විධිවිධානයක් හෝ විධිවිධාන උල්ලංඝනය කිරීම සහ එම විධිවිධාන අනුව ක්‍රියාකිරීමේ බලය ඇති අයෙකුට තම රාජකාරි කටයුතු ඉටුකිරීමට බාධා කිරීම මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් වන්නේය.

වැරදි හා දණ්ඩන

(2) (1) වන උප වගන්තියේ සඳහන් වරදක් සිදුකරන සෑම තැනැත්තෙකුටම නිසි අධිකරණ බලයක් ඇති අධිකරණයක් ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසුව වරදකට වරදකරුවකු වන අතර, එසේ වරදකරු කරනු ලැබුවහොත් ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල් දහදාහක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයකට බන්ධනාගාර ගතකරනු ලැබීමට හෝ එම දඬුවම් දෙකටම හෝ යටත් විය යුතුය.

**අර්ථ නිරූපන**

පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම ප්‍රඥප්තියෙහි.

"පළාත" යනුවෙන්, මධ්‍යම පළාත ද,

"ආණ්ඩුකාරවරයා" යන්නෙන් මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවරයා ද,

"පළාත් සභාව" යන්නෙන් මධ්‍යම පළාතේ පළාත් සභාවද,

"මධ්‍යස්ථාන" යන්නෙන් අදහස් වන්නේ මුල් ළමාවියේ පසුවන ළමුන්ගේ නිපුණතා සංවර්ධනය කරනු ලබන පුද්ගලයෙකු, පුද්ගල මණ්ඩලයක් හෝ එවැනි ආයතනයක් මෙන්ම මුල් ළමාවියේ පසුවන දරුවන් රැකබලා ගන්නා දිවා සුරැකුම් මධ්‍යස්ථානයන්ය.

"අධ්‍යක්ෂවරයා" යන්නෙන් මෙම ප්‍රඥප්තියේ අධ්‍යක්ෂවරයා වශයෙන් විධිමත් පත්කර ඇති නිලධාරියා ද ඔහු වෙනුවෙන් කටයුතු කිරීමට නිසි බලයලත් නිලධාරියා ද,

"පළාත් රාජ්‍ය සේවය" යන්නෙන් 1987 අංක 42 දරන පළාත් සභා පනතේ අර්ථය අතරට ගැනෙන පළාත් රාජ්‍ය සේවය ද,

"උපදේශක උපදේශිකාවන්" යන්නෙන් මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක නිපුණතා සංවර්ධන කාර්යයේ යෙදෙන්නන් සහ වතු ආශ්‍රිත මධ්‍යස්ථානවල කටයුතු කරන ළමා සංවර්ධන නිලධාරිනි, නිලධාරින් ද,

"කළමණාකරුවන්" යනුවෙන් මධ්‍යස්ථාන පවත්වාගෙන යනු ලබන ව්‍යවසායකයින්ද, හිමිකරුවන්ද, පාලකයන්ද,

"විශේෂ ළමුන්" යනුවෙන් මධ්‍යස්ථාන වලට යායුතු වයසේ සිටින පෙනීම දුබලවීම, ඇසීම දුබලවීම, කායික ආබාධිත තත්වයන් හා සෙමෙන් මනස වැඩෙන දරුවන් ආදී විශේෂිත ළමුන් ද,

"මධ්‍යස්ථාන පවත්වාගෙන යන තැනැත්තෙකු" යනුවෙන් මධ්‍යස්ථාන පවත්වාගෙන යනු ලබන පුද්ගලයෙකු, ව්‍යවසායකයෙකු හෝ ස්වේච්ඡා සංවිධානයක් හෝ සංස්ථාගත ආයතනයක් ද,

"නියමිත දිනය" යනුවෙන් මෙම ප්‍රඥප්තිය ආණ්ඩුකාරවරයා අනුමත කළ දිනය ද අදහස් වේ.

මෙම ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ හෝ ඉංග්‍රීසි භාෂා පාඨ අතර, යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එහි සිංහල පාඨය බල පැවැත්විය යුතු ය.

06 - 106

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.